UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016
ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු

BUDDHIST PHILOSOPHY - I / බෞද්ධ දර්ශනය I - (BPG I)
(ආචාර විද්‍යාව හා මනෝවිද්‍යාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
**ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

## I - කොටස

1. බෞද්ධ සන්දර්භය තුළදී ආචාර ධර්මය යන්න ඔබ විග්‍රහ කරන්නේ කෙසේද?

2. "බුදුන් වහන්සේ සදාචාරාත්මක ප්‍රතිසංස්කරණයකට මුල් වූ ශාස්තෘවරයෙකි." ප්‍රාග් බෞද්ධ භාරතීය චින්තන පසුතලය අනුව මෙම ප්‍රකාශය විමසන්න.

3. බෞද්ධ ආචාර විද්‍යා සන්දර්භය තුළ ඉගැන්වෙන පුණ්‍ය, පාප යන සංකල්පවල භූමිකාව පැහැදිලි කරන්න.

4. සදාචාරවත් ජීවිතයක් පවත්වාගෙන යාමේදී කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් නිවැරැදි පදනමක් ලෙස යොදාගත හැක්කේ දැයි සාකච්ඡා කරන්න.

5. දඬුවම යන්න සමර්ථනය කළ හැකිද? දඬුවමෙහි ස්වරූපය බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ සන්දර්භය ඇසුරෙන් පරීක්‍ෂා කරන්න.

## II - කොටස

6. බුදු සමයේ කවර නම් මනෝවිද්‍යාත්මක අන්තර්ගතයක් ඇත්දැයි සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

7. බටහිර මනෝවිද්‍යාව සමග සසඳා බැලීමේ දී බෞද්ධ මනෝවිද්‍යාවේ සුවිශේෂත්වය පිරික්සන්න.

8. පෞරුෂය යනු කුමක්දැයි පැහැදිලි කරමින් පෞරුෂය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාවේ එන විග්‍රහය සාකච්ඡා කරන්න.

9. අභිප්‍රේරණ හා චිත්තවේග පිළිබඳ සංකල්ප පැහැදිලිකර චිත්තවේග පාලනය කිරීමට දී ඇති බෞද්ධ උපදෙස් සූත්‍රානුසාරයෙන් සාකච්ඡා කරන්න.

10. මානසික අසහනය දුරු කිරීම සඳහා බුද්ධ දේශනාවන්ගේ මනෝ විද්‍යාත්මක වැදගත්කම සූත්‍ර දේශනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

==========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු

BUDDHIST PHILOSOPHY - II / බෞද්ධ දර්ශනය- II - (BPG - 2)
(බෞද්ධ දර්ශන ඉතිහාසය, තුලනය හා භාවිතය)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි)

---

1. සමකාලීන ආගමික හා දර්ශනික දෘෂ්ටි පිළිබඳ බුදුන් වහන්සේගේ විචාරය පහද දෙන්න.

2. බුදු දහම කෙතෙක් දුරට ස්වච්ඡන්දයට ඉඩදී තිබේදැයි පරීක්ෂා කරන්න.

3. නිර්මාතෘ දේව සංකල්පය පිළිබඳ බෞද්ධ විචාරය විමසීමට ලක්කරන්න.

4. බුදුන් වහන්සේගේ දේශනා තුළ පෙන්වා දෙන පරිදි පුඤ්ඤ හා කුසල අතර වෙනස්කම් සාකච්ඡා කරන්න.

5. ප්‍රථම ථෙරවාද සංගායනාවට බලපෑ බහුවිධ හේතු පරීක්ෂා කරන්න.

6. අභිධම්ම පිටකයේ ආරම්භය හා විකාශය පිළිබඳ විචාරයක් කරන්න.

7. ශූන්‍යතාව ප්‍රතීත්‍යසමුත්පාදය වශයෙන් ආචාර්ය නාගාර්ජුන පාදයන් පැහැදිලි කරන ආකාරය මාධ්‍යමික සම්ප්‍රදය ඇසුරෙන් පහද දෙන්න.

අනෙක් පිටුවට ...

8. මහායාන ඉගැන්වීම් තුළ පෙන්වා දෙන ත්‍රිකාය සිද්ධාන්තය විමසීමට ලක්කරන්න.

9. යෝගාචාර සම්ප්‍රදයෙහි මූලික ඉගැන්වීම් පරීක්‍ෂාකොට ඒවා මූලික බුදුදහමේ ඉගැන්වීම් සමඟ කෙසේ සැසඳේදැයි පෙන්වා දෙන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් හතරකට කෙටි සටහන් ලියන්න.

I. පරියාය දේසනා
II. බෝධි චිත්ත
III. බාහ්‍යාර්ථානුමේය වාද
IV. මහාවිභාෂා
V. පරියත්ති සාසන
VI. ප්‍රත්‍යක්‍ෂය
VII. අන්තරාභව
VIII. සව ලක්‍ෂණ

=========

**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGST 2016
ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2016 අගෝස්තු

BUDDHIST PHILOSOPHY - III / බෞද්ධ දර්ශනය- III - BPG - 3
(පාරභෞතික විද්‍යාව හා ඥානමීමාංසාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි.)

---

## I - කොටස

1. බ්‍රහ්මජාල සූත්‍රයෙහි දී බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කළ දෘෂ්ටීන් තුළ නිරූපණය වන ප්‍රධාන ස්ථාවරයන් පැහැදිලි කරන්න.

2. ප්‍රාග් බෞද්ධ චින්තනයේ ඉගැන්වූ බ්‍රහ්ම සංකල්පයට බෞද්ධ චින්තනය තුළ නව අර්ථකථන ලබාදුන් අයුරු පැහැදිලි කරන්න.

3. බුදුන් වහන්සේ 'අත්මයක් ඇත' යන මතය මෙන්ම 'ආත්මයක් නැත' යන මතය ද බැහැර කළ බව කීම නිවැරදි ද? ඔබගේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

4. බුදුරදුන් විසින් ඇතැම් ප්‍රශ්න අව්‍යාකෘත වශයෙන් දැක්වීමට හේතු විමසන්න.

5. බුදුසමයේ ඉගැන්වෙන නිර්වාණය අධිභෞතික සත්තාවක්ද? සාකච්ඡා කරන්න.

## II - කොටස

6. බෞද්ධ ඥානවිභාගය එක්තරා ආකාරයක අනුභූතිවාදයක් සේ සැලකිය හැක්කේ කුමන පදනමකින් දැයි විමසන්න.

අනෙක් පිටුවට ...

7. සාම්ප්‍රදායික අධිකාරය පාරමාර්ථික වශයෙන් සප්‍රමාණ ඥානමාර්ගයක් ලෙස නොසලකා ප්‍රතික්ෂේප කිරීමට බුදුන් වහන්සේ දැක්වූ හේතු, පෙළ සාහිත්‍යයෙහි එන ඉගැන්වීම් ඇසුරු කරමින් පරීක්ෂා කරන්න.

8. සත්‍යයේ මිණුම් දණ්ඩක් ලෙස ශ්‍රැතියම ප්‍රමාණ වශයෙන් ගැනීමෙන් බෞද්ධ විමුක්තිය සලසා ගත නො හැක්කේ මන්දැයි පැහැදිලි කරන්න.

9. ඉන්ද්‍රිය හා අතීන්ද්‍රිය ඥානය අතර ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනස පැහැදිලි කරන්න.

10. ඥාන සංකල්පය පිළිබඳව ප්‍රාග් බෞද්ධ චින්තනයේ මතු කරන ලද ගැටලු වෙත අවධානය යොමු කරමින් බුදුන් වහන්සේගේ විමුත්තිඤාණ සංකල්පය පැහැදිලි කරන්න.

===========